**එක්සත් රාජධානිය යකඩ පාලම් ව්‍යාපෘතිය -2015**

**------------------------------------------------------------**

බ්‍රිතාන්‍ය රජයේ මූල්‍ය සහාය භාවිතයෙන් ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතියේ අදියර II (එක්සත් රාජධානිය යකඩ පාලම් ව්‍යාපෘතිය) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සීමාසහිත හොංකොං සහ ෂැන්හායි බැංකු සහයෝගීතා සමාගම සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2013 ජුනි 21 දින එළඹි අංක 53එම්/එෆ්සී/1448(201327/එස්එල්) දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ග්‍රාමීය පාලම් 104 ක් ඉදිකිරීම සඳහා සැලසුම් කිරීම, මැනුම් කිරීම හා යකඩ ද්‍රව්‍ය සැපයීම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා තාක්ෂණික සහාය සහ පුහුණුව ලබා දීමයි. ඒ සඳහා 2012 අප්‍රේල් 26 වන දින මාර්ග සංවර්ධන අධිකාරිය විසින් විදේශීය සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ණය ගිවිසුමට අනුව මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුලු පිරිවැය ස්ටර්ලිං පවුම් මිලියන 56.50 කට (ඇ.එ.ජ.ඩො මිලියන 88.72) සමාන රු. මිලියන 12,275.13 ක් වන අතර ඉන් ස්ටර්ලිං පවුම් මිලියන 45 කට (ඇ.එ.ජ.ඩො මිලියන 70.65) සමාන රු. මිලියන 9,775.13 ක් සීමා සහිත හොංකොං සහ ෂැන්හායි බැංකු සහයෝගීතා සමාගම විසින් ලබා දීමට එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2013 සැප්තැම්බර් 19 වන දින ආරම්භ කරන ලද අතර 2017 සැප්තැම්බර් 18 වන දින එය අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත

සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 2.1 මතය

---------------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කිරීම | අරමුදල් උපයෝජනය<br>සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | ඇ.එ.ජ.ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | ඇ.එ.ජ.ඩො මිලියන | රු. මිලියන | ඇ.එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| එච්එස්බීසී | 70.65 | 9,775.13 | 2,075.00 | 13.97 | 1,856.77 | 60.72 | 7,982.75 |
| ශ්‍රීලංර | 18.07 | 2,500.00 | 497.40 | 3.40 | 497.35 | 7.62 | 1,113.93 |
| **එකතුව** | **88.72** | **12,275.13** | **2,572.40** | **17.37** | **2,354.12** | **68.34** | **9,096.68** |

### 3.2 භෞතික ප්‍රගතිය

ලද තොරතුරු අනුව, කොන්ත්‍රාත්තුවට අයත් වැඩ විෂයපථය යටතේ දිග මීටර් 3,077.90 කින් යුත් ග්‍රාමීය පාලම් 104 ක් මැනුම් කිරීම, සැලසුම් කිරීම, තාක්ෂණික සහය හා පුහුණුව සහ අමුද්‍රව්‍ය සැපයීම සඳහා පිරිවැය ස්ටර්ලිං පවුම් මිලියන 45 කට (ඇ.එ.ජ.ඩො. මිලියන 70.65) සමාන රු.මිලියන 9,775.13 ක මුදලක් සඳහා විදේශ සමාගමක් සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට අවස්ථා 04 කදී එය වෙනස් කර තිබුණු අතර, දිග මීටර් 3,135.90 ක් වූ තාවකාලික පාලම් 16 ක් හා සංයුක්ත පාලමක් ද ඇතුළු පාලම් 80 ක් සඳහා අමුද්‍රව්‍ය සැපයීමට එකඟ වූ නමුත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම පාලම් වලින් ඉදිකිරීම් අවසන් කර තිබුණේ තාවකාලික පාලම් 10 ක් හා සංයුක්ත පාලම ඇතුළු පාලම් 39 ක් පමණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාලම් 09 ක ඉදිකිරීම් කටයුතු මාස 05 සිට මාස 20 ක් දක්වා කාල පමාවකින් යුක්තව සිදුකර තිබුණු අතර ඊට වැඩ බිම් අත්පත්කර ගැනීමේ ගැටළු, සැලසුම් වෙනස් කිරීම් සහ වැඩබිම් වෙනස් කිරීම් හේතුවිය. තවද 2015 දෙසැම්බර් 31 දිනට පාලම් 70 ක් සඳහා අවශ්‍ය පාලමේ ප්‍රධාන ව්‍යුහයට අදාළ යකඩ ද්‍රව්‍ය සැපයීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණද, පාලම් 65 ක් සඳහා පමණක් එම ද්‍රව්‍ය සපයා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී පාලම් 26 ක් සඳහා පිරිවැය රු. මිලියන 243.86 ක් වූ විචලතා නියෝග 47 ක් අනුමත කර තිබුණි. ඒ සඳහා අනපේක්ෂිත භූ විද්‍යාත්මක තත්ත්වයන්, අතිරේක වැඩ, වැරදි ප්‍රමානයන් මත ඇස්තමේන්තු සකස් වීම නිසා ප්‍රතිපාදන ප්‍රමානවත් නොවීම් හේතු වු බව දක්වා තිබුණද, ආරම්භක අධියරේදී නිසි අවධානය යොමුකර තිබුණේ නම් එම අතිරේක පිරිවැය වළක්වා ගැනීමට හැකිව තිබුණු බවද නිරීක්ෂණය විය.

## 3.4 මතභේදයට තුඩුදෙන ගැටළු

------------------------------------

විදේශීය සමාගම සමඟ වූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුවේ පිරිවැය ස්ටර්ලිං පවුමට තීරණය කර ඇති අතර ණය ගිවිසුම අනුව ණය මුදල එක්සත් ජනපද ඩොලර් වලින් තීරණය කර තිබුණි. ගණනය කිරීම් අනුව පසුගිය වර්ෂ 03 ක කාලය තුළ ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ස්ටර්ලිං පවුම් අවප්‍රමාණය වීම නිසා ශුද්ධ හුවමාරු අලාභය ඇමෙරිකානු ඩොලර් 892,781 ක් එනම් රු. මිලියන 130.51 ක් වී තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවවේ අනුමැතියකින් තොරව ව්‍යාපෘතියේ උපදේශකවරුන් 05 දෙනෙකු සහ මහජන සම්බන්ධතා නිලධාරින් 04 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 1.08 ක් ගෙවා තිබුණු බවට නිරීක්ෂණය විය.